ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2163/9 - 2020 පෙබරවාරි මස 17 වැනි සඳුදා - 2020.02.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥාපනතේ (255 අධිකාරිය) 184 (1අ) වගන්තිය යටතේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154(ඇ) වගන්තියෙන් ද, මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 07 දරන පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 2(2) වගන්තියෙන් ද මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර නීතිඥ ලලිත් යූ. ගමගේ වන මම තලවකැලේ ලිඳුල නගර සභාවේ සභාපතිවරයා විසින් නගර සභා ආඥාපනතේ (255 අධිකාරිය) 184 (1) වගන්තියේ සහ මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 2(1) වගන්තියේ සඳහන් වැරදි කිසිවක් සිදුකර ඇත්තේ ද යන්න පිළිබඳව මෙම දැන්වීමේ දින සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත පරීක්ෂා කොට මා වෙත වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් අධිකරණ නිලධාරිණී සරෝජිනී කුසලා වීරවර්ධන මහත්මිය මෙයින් පත් කරමි.

මෙම නිලධාරියාට මෙම පරීක්ෂණයට අදාලව පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත්කරන ලද කොමිෂමක බලතල ඇත්තේය.

**ලලිත් යූ. ගමගේ (නීතිඥ),**
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

2020 පෙබරවාරි මස 17 වැනි දින,
මහනුවර දී ය.

03 - 25

1A - PG 4882 - 17 (2020/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.